# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1992 අංක 69 දරන ජාත්‍යන්තර ක්‍රිෂ්ණා විඥාන (ඉස්කොන්) සමිතියේ ශ්‍රී ලංකා ශාඛාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 දෙසැම්බර් මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1993 ජනවාරි මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

**1992 අංක 69 දරන ජාත්‍යන්තර ක්‍රිෂ්ණ විඥාන (ඉස්කොන්) සමිතියේ ශ්‍රී ලංකා ශාඛාව (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1992 දෙසැම්බර් මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 11/91

**ජාත්‍යන්තර ක්‍රිෂ්ණ විඥාන (ඉස්කොන්) සමිතියේ ශ්‍රී ලංකා ශාඛාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ජාත්‍යන්තර ක්‍රිෂ්ණ විඥාන (ඉස්කොන්) සමිතියේ ශ්‍රී ලංකා ශාඛාව" යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන සංගමයක් එහි සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ සංගමයට අදාළ සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් කොළඹ පිහිටුවා තිබුණු හෙයින් ද: පූර්විකාව.

එකී සංගමය විසින් එහි පොදු පරමාර්ථ සහ කාරණා මෙතෙක් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ ඒ සමිතිය සංස්ථාගත කරන මෙන් ඉල්ලා ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 69 දරන ජාත්‍යන්තර ක්‍රිෂ්ණ විඥාන (ඉස්කොන්) සමිතියේ ශ්‍රී ලංකා ශාඛාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාත්‍යන්තර ක්‍රිෂ්ණ විඥාන (ඉස්කොන්) සමිතියේ ශ්‍රී ලංකා ශාඛාවේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාගත කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් "ජාත්‍යන්තර ක්‍රිෂ්ණ විඥාන (ඉස්කොන්) සමිතියේ ශ්‍රී ලංකා ශාඛාව" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තවද, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ජාත්‍යන්තර ක්‍රිෂ්ණ විඥාන (ඉස්කොන්) සමිතියේ ශ්‍රී ලංකා ශාඛාව සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) සමාජයේ සාමාන්‍ය ජනතාව තුළ අධ්‍යාත්මික දැනීම ක්‍රමානුකූලව පතුරුවාලීම සහ ජීවිතයේ වටිනාකම්වල අතුල්‍යතාව නැති කිරීම අරභයා සහ ජාත්‍යන්තර ක්‍රිෂ්ණ විඥාන සමිතියේ ආරම්භක කර්තෘ වූ ශ්‍රද්ධෝත්තම ඒ. සී. භක්තිවේදාන්ත ස්වාමි ප්‍රභුපාද ස්වාමිතුමන්ගේ ඉගැන්වීම් ක්‍රම අනුගමනය කිරීමෙන් සහ පතුරුවාලීමෙන් සර්වානු එක්සත්භාවය සහ ලෝක සාමය ඇති කිරීම උදෙසා සියලු ජාතීන්ට අධ්‍යයනයක් ලබා දීමට ප්‍රයත්න දැරීම;

(ආ) භගවත් ගීතයෙන් සහ ශ්‍රීමත්-භගවතාම් වලින් හෙළිදරව් කොට ඇති පරිදි ක්‍රිෂ්ණ විඥානය පැතිරවීම;

(ඇ) සංස්ථාවේ සාමාජිකයන් එකිනෙකා සමග සම්බන්ධයකට යොමු කිරීම සහ ක්‍රිෂ්ණා වෙත සමීප කරවීම සහ එක් එක් ආත්මය වූකලී මූලික දේවත්වයේ (ක්‍රිෂ්ණගේ) තත්වයේ කොටසක්ය යන අදහස එමගින් සාමාජිකයන් අතර සහ පොදු මහජනයා අතර ඇති කිරීම;

(ඈ) ස්වාමි ශ්‍රී චෛතන්‍ය මහාප්‍රභුගේ ඉගැන්වීම්වලින් අනාවරණය කර ඇති පරිදි සංකීර්තන ව්‍යාපාරය (දෙවියන් ගේ ශුද්ධ වූ නාමාවලි ස්තෝත්‍ර සාමූහිකව ගායනා කිරීම) ඉගැන්වීම සහ ඊට ධෛර්ය දීම;

(ඉ) ක්‍රිෂ්ණගේ පෞද්ගලිකත්වයට කැපවූ අත්‍යුත්තර වන්දනාමාන උදෙසා සාමාජිකයන් සහ සාමාන්‍ය මහජනයා සඳහා ශුද්ධ ස්ථානයක් ඉදි කිරීම;

(ඊ) වඩා සරල වූත් ස්වාභාවික වූත් දිවි පෙවෙතක් ගත කිරීමට සාමාජිකයන් දිරිගැන්වීම; සහ

(උ) වාර සංග්‍රහ, පොත් සහ වෙනත් ලේඛන ප්‍රසිද්ධ කිරීම.

**සංස්ථාවේ සාමාන්‍ය බලතල.**

4. සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටු කරගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර විවිධ ආකාරයක සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, ඉටු කිරීමේ, සිදු කිරීමේ සහ ක්‍රියාවේ යෙදීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.**

5. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීති මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි හා ඒ අනුව තෝරා පත් කරගනු ලබන නිලධරයන්ගෙන් හා වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් විසින් එකී රීතිවලට යටත්ව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී ධුර දැරූ සමිතියේ කළමනාකරණ මණ්ඩලය විය යුතු ය.

**සංස්ථාවේ රීති.**

6. (1) සංස්ථාවේ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද කළමනාකරණ මණ්ඩලයේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් ද සංස්ථාවේ රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සහ එහි පරමාර්ථ ඉටු කිරීම සම්බන්ධයෙන් ද මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාවේ යම් මහා සභා රැස්වීමකදී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එසේ සාදනු ලැබූ යම් රීතියක් එවැනිම රැස්වීමකදී එවැනිම ආකාරයෙන් වෙනස් කිරීම, ඊට සමඟ එකතු කිරීම, එය සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය:

එසේ වුවද, කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබුවහොත් මිස, එවැනි යම් වෙනස් කිරීමක්, එකතු කිරීමක්, සංශෝධනයක් හෝ පරිච්ඡින්න කිරීමක් බලාත්මක නොවන්නේ ය.

(2) සංස්ථාවේ සියලු සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තාහ.

**සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.**

7. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ නියාදනය කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමටත්, දැරීමටත්, නීත්‍යනුකූලව සංස්ථාවට බලය ඇත්තේ ය. තවද ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව එකී සියලු දේපළ දැරිය යුතු ය.

**සංගමය විසින් ගෙවිය යුතු සහ අය විය යුතු ණය.**

8. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී සංගමයේ පැවැති සියලු ණය හා බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතු සියලු ණය හා සමිතියට ගෙවිය යුතු සම්මාදම් හා දායක මුදල් මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු**

9. සංස්ථාවේ සභාපති සහ ලේකම් හෝ භාණ්ඩාගාරික ඉදිරිපිටදී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයට තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් තැබීම යම් තැනැත්තකු සාක්ෂිකරුවකු වශයෙන් කළ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුදල් යෙදවීම.

10. සංස්ථාවට කවර ආකාරයකින් වුවද ලැබෙන ආදායම සහ දේපළ මේ පනතේ සඳහන් පරිදි සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහාම පමණක් යෙදවිය යුතු අතර, සංස්ථාවට අයත් වත්කම් කිසිවක් ශ්‍රී ලංකාවේ දේශ සීමාවලින් බැහැරට ගෙනයාම හෝ එකී සීමාවලින් බැහැර යම් කාර්යයක් සඳහා යෙදවීම හෝ යම් දේපළක් භාර ගන්නා ලද්දේ යම් භාරයකට යටත්වද එවැනි භාරයක කොන්දේසි උල්ලංඝනය කරමින් ඒ දේපළ යම් කාර්යයකට යෙදවීම හෝ නොකළ යුතු ය.

ප්‍රතිපත්ති හෝ මූලධර්ම පිළිබඳ ආරාවුල් තීරණය කිරීම.

11. මේ පනතින් හෝ, වෙනත් යම් ලිඛිත නීතියකින් විධිවිධාන සලසා ඇතිතාක් දුරට හැර සංස්ථාවේ ප්‍රතිපත්ති හෝ මූලධර්ම සම්බන්ධයෙන් හෝ එවැන්නකට බලපාන යම් කාරණාවක් නැතහොත් ප්‍රශ්නයකට අදාළව උද්ගත වන යම් ආරාවුලක් හෝ සැකයක් ඉන්දියාවේ සිටින ශ්‍රී ලංකාව සඳහා වූ පාලන මණ්ඩලයේ කොමසාරිස්වරයා වෙත යොමු කළ යුතු අතර, ඔහුගේ තීරණය අවසානාත්මක වන්නේය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

12. මේ පනතේ සඳහන් තැනැත්තන් හා ඔවුන් වෙතින්, ඔවුන් මගින් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

13. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තු සභාවේ සියලු පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 870 කි (විදේශීය) රු. 1,160 කි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම නොවැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව ලැබෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.